ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

පුවත් පත් නිවේදනය

2019-20 අධ්‍යාන වර්ෂය සඳහා ඩයස්පෝරා දරුවන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන

ඉන්දියානු රජය විසින් 2006-07 වර්ෂයේ සිට "ඩයස්පෝරා දරුවන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහනක් (SPDC) ක්‍රියාත්මක කරයි. මෙම ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ඉන්දියානු විශ්ව විද්‍යාල/ආයතනවල උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයින්ට සහ අනේවාසික ඉන්දියානු ජාතිකයින්ට මුල්‍යාධාර ලබා දේ.

2. ශ්‍රී ලංකාවේ මෙම කාණ්ඩයට අයත් සිසුන්ද මෙම ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලබන අතර, ඔවුන්ට ඒ යටතේ වෘත්තීය හා වෘත්තීය නොවන පාඨමාලා (වෛද්‍ය / පරිපූරක වෛද්‍ය විද්‍යාව හැර) හැදෑරීම සඳහා මුල්‍යාධාර ලබා ගත හැක. නවක සිසුන්ට (පළමු වසර) පමණක් මේ සඳහා අයදුම් කළ හැක. ඉන්දියාවේ උසස් ද්විතියික අධ්‍යාපන පාඨමාලා හැදෑරූ සිසුන්ට මෙම ශිෂ්‍යත්ව සඳහා අයදුම් කළ නොහැක.

3. වැඩි විස්තර http://www.spdcindia.gov.in/login/guideline.php යන වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. සුදුසුකම් ලත් සිසුන්ට 2019 නොවැම්බර් 30 වැනිදා දක්වා අයදුම්පත් යොමු කළ හැක.

2019. 08. 09

කොළඹ